**කළමනාකරණය පිළිබඳ පශ්චාත්උපාධි ආයතනය - 2015**

**----------------------------------------------------------**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5)උප වගන්තිය, 108 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**
---------------

**2.1** **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

**2.2.1.** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**
----------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**
------------------------------------------

වියදම් වර්ගීකරණය කිරීමේ දී වියදමේ ස්වභාවය අනුව හඳුනාගැනීම වෙනුවට කාර්ය අනුව වියදම් වර්ගීකරණය කර තිබුණි. කෙසේ වුවද වියදම්වල ස්වභාවය පිළිබඳව අතිරේක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

**(ආ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**
---------------------------------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගණනය කිරීම මූල්‍ය ප්‍රකාශ දත්තවලට අනුකූලව සිදු කර නොතිබුණි. ඒ අනුව තොගයෙහි අඩුවීම රු. 171,905 ක් අඩුවෙන්ද, උපචිත වියදම් අඩුවීම රු. 80,239 ක් වැඩියෙන්ද වෙනත් වගකීම්වල අඩුවීම රු. 984,145 ක් වැඩියෙන්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් කර තිබුණි.

**(ඇ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**
---------------------------------------------

ඉකුත් වර්ෂවල ක්ෂය ගණනය කිරීමේ දෝෂ නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද රු. 1,441,955 ක ගැලපීම් හේතුවෙන් සංසන්දනාත්මක සංඛ්‍යාවලට සිදුවන ප්‍රමාණාත්මක බලපෑම ගිණුම් පරිශීලනය කරන්නන්ට අවබෝධ කර ගැනීම සඳහා අදාල සංඛ්‍යා අතීතයානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

**-----------------------------------------------**

(i) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන අගයට ප්‍රකාශ කර ඇති විට ඒ පිළිබඳව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කළ යුතු නමුත් 2014 අප්‍රේල් 01 දින ප්‍රත්‍යාගණනය කරන ලද පිරියත උපකරණ ගෘහභාණ්ඩ, කාර්යාලීය උපකරණ සහ රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ පිළිබඳ සමාලෝචිත වර්ෂයේ ගිණුම් සටහන්වලින් ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ii) 1995 වර්ෂයේ අත්පත් කරගෙන තිබූ පිරිවැය රු. 60,610,211 ක් වූ ගොඩනැගිලි ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව සම්පූර්ණයෙන් ක්ෂය විය යුතු නමුත් ක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් තවදුරටත් රු. 3,327,695 ක ශුද්ධ ශේෂයක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද, මෙම වත්කම ප්‍රයෝජනවත් තත්ත්වයක පැවති බැවින් ක්ෂය අනුපාත සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(iii) ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 66,258,768 ක් වූ ගොඩනැගිලි හා මෝටර් රථ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි.ඒ අනුව ක්ෂය අනුපාත ඇස්තමේන්තු කිරීමේ දී වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට ආධාර වශයෙන් ලැබී තිබුණු පුස්තකාල පොත් සහ කාලීන වාර්තාවල අගය ගිණුම්ගත කර නොතිබුණු අතර භාවිතයෙන් ඉවත් කරන පුස්තකාල පොත් සහ කාලීන වාර්තාවල අගය ගැලපීමක්ද සිදු කර නොතිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මෝටර් වාහන ක්ෂය රු.313,742 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 2 ක් සඳහා ලැබිය යුතු පොලී ආදායම් රු. 168,031 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**----------------------------------**

ආයතනය විසින් පිළියෙල කර තිබුණු වත්කම් ලේඛණය අනුව පිරිවැය රු. 2,600,000 ක් වූ වාහනයක් පවතින බව පෙන්නුම් කළ නමුත් එවැනි වාහනයක් භෞතිකව පවතින බව විගණනයට තහවුරු නොකෙරිණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2007 වර්ෂයේ දී ඩුබායි නගරයේ ජාත්‍යන්තර ශාඛාවක් ආරම්භ කර තිබූ අතර, වංචාවක් හේතුවෙන් 2009 සැප්තැම්බර් මාසයේ දී එකී ශාඛාව වසා දමා තිබූ නමුත්, එම ශාඛාවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ වශයෙන් පිළිවෙලින් රු. 1,641,000 ක් හා රු.7,860,000ක් දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණි.මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනයක් සිදු කෙරන බව ආයතනයේ අධ්‍යක්ෂ විසින් විගණනයට වාර්තා කර තිබුණි.

(ආ) කළමනාකරණ පාඨමාලාවක් වෙනුවෙන් 2014 ඔක්තෝබර් මාසයේදී රාජ්‍ය බැංකුවකින් ලැබී තිබූ නමුත් උපලබ්ධි නොවූ රු.52,500 ක චෙක්පතට අදාල මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය** | |
| (i) IX වන පරිච්ඡේදයේ 5.1 (අ) වගන්තිය සහ 7 වන පරිච්ඡේදයේ 21.1 ඡේදය සහ 21.3 ඡේදය | පරිපාලන ශ්‍රේණිවල හෝ ඊට සමාන ශ්‍රේණිවල නිලධාරීන්ට අතිකාල දීමනා ලැබීමට හිමිකමක් නොමැති බවත් නිවාඩු දිනවල සේවය කිරීමේ දීමනා ගණනය කිරීමේ දී සේවයේ නිරත වූ කාලය පැය 7 කට වැඩි නම් පමණක් දිනක ඒකාබද්ධ වැටුප පදනම් කරගත යුතු බවත් දක්වා තිබුණ ද ඊට පටහැනිව ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයාට සහ පද්ධති විශ්ලේෂක 1ශ්‍රේණිය නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂයේ නිවාඩු දින වැටුප් සහ අතිකාල දීමනා වශයෙන් එකතුව රු.1,252,800 ක් ගෙවාතිබුණි. |
| (ii) XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා පුස්තකාල පොත් පිළිබඳව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (iii) II වන පරිච්ඡේදයේ 4 හා 5 ඡේද සහ මුදල් රෙගුලාසි 770 සහ 772 | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ඇතුළු ගනුදෙනුවේ විනිවිදභාවයට අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව රු.728,250ක් වටිනා කාර්යාල උපකරණ රු.30,625කට සේවකයන්ට අලෙවි කර තිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ආයතනයේ භෞතික හා මානව සම්පත් භාවිතා කරමින් ආයතනයේ නිල මුද්‍රාව සහිතව සහතික පත්‍ර ප්‍රදානය කරමින් 2015 වර්ෂය තුළ කළමනාකරණ සංවර්ධන පාඨමාලා 10 ක් පවත්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ නිම කරන ලද වැඩසටහන් 7 ක ශුද්ධ අතිරික්තය වූ රු.5,873,341 ක් 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව උපදේශන සේවා සැපයීම ලෙස සලකා කාර්ය මණ්ඩලය අතර බෙදා දී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.40,054,887 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.38,172,909 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.1,881,978 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමස්ත වියදම රු.26,959,049 කින් වැඩි වී තිබුණද පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම රු.30,239,718 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය කිරීමේ දී 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් තිබුණද ඉන් පසු අඛණ්ඩව අතිරික්තයක් ඇති වී තිබුණි. ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය, සේවක පාරිශ්‍රමික හා රජයට ගෙවූ බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු 2011 වර්ෂයේ රු.33,013,010 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.117,144,037 ක් දක්වා වැඩිවී තිබූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 17 ක වැඩිවීමකි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

-----------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ හිටපු නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති අංක LT/01/05/2012 දරණ නඩුවට අදාලව මැදිහත්වන වගඋත්තරකරුවකු වශයෙන් ආයතනය නම් කර තිබුණි.

(ආ) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ඩුබායි ශාඛාවේ රු.මිලියන 58.2ක වංචාව සම්බන්ධයෙන් 2009 වර්ෂයේදී පැවති පොදු ව්‍යාපාර කමිටු වාර්තාව මගින් සිදු කරන ලද නිර්දේශ පදනම්ව විමර්ශනය සඳහා 2011 මාර්තු 29 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණද අදාල පරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

--------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයින් 427 දෙනෙකු වෙනුවෙන් පුනරාවර්තන වියදම ලෙස රු. 165,099,814 ක් වැයකර තිබුණු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 279 දෙනෙකු වෙනුවෙන් රු.138,290,583 ක් වැය කර තිබුණි. ඒක ශිෂ්‍ය පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.109,015 කින් හෙවත් සියයට 22 කින් අඩු වී තිබුණි.

(ආ) ව්‍යාපාර පරිපාලනාධිපති (MBA) පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන්ගෙන් සියයට 17 සිට සියයට 23 දක්වා ප්‍රතිශතයක් උපාධිය සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දර්ශන විශාරද (PHD) උපාධිය සඳහා 43 දෙනෙකු ලියාපදිංචිව තිබූ නමුත් එක් අයෙකු පමණක් උපාධිය සම්පූර්ණ කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 අගෝස්තු 31 දිනැති අංක 241.4 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව දිනකට පැය 08 ඉක්මවා වැඩ කරන දිනයක් සඳහා ඉන්ධන දීමනා ලබා ගත හැකි වුවද පැය 08 කට වඩා අඩුවෙන් වැඩ කළ දිනයන්ද ඉන්ධන දීමනා ගෙවීම් ගණනය සඳහා සැලකිල්ලට ලක් කර තිබීම නිසා වර්ෂය තුළ රු. 251,100 ක ඉන්ධන දීමනා වැඩියෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය හා ආරාධිත කථිකාචාර්යවරියක සමග ඇති කර ගත් සේවා ගිවිසුමට අනුව කථිකාචාර්යවරිය විසින් සැපයූ සේවය වෙනුවෙන් පැයකට කළ යුතු ගෙවීම් රු. 2,500 ක් වුවද පැයක් සඳහා රු. 4,500 බැගින් 2015 ජූලි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා පැය 35 ½ ක් සඳහා රු. 71,000ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනාධිපති උපාධි පාඨමාලාවේ තොරතුරු කළමනාකරණ විෂය සඳහා රු. 88,000 ක මාසික වැටුපක් ලබන නිත්‍ය දේශකවරයකු සිටියදී බාහිර දේශකවරු පස් දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේ දී ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා රු. 364,500 ක් ගෙවා තිබුණි. එම කාලපරිච්ඡේදය තුළදී නිත්‍ය දේශකවරයා දේශන පැය 09 ක් පමණක් පවත්වා තිබියදී බාහිර දේශකවරු දේශන පැය 81 ක් පවත්වා තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත මානව සම්පත් සැලසුම අනුව අනුමත කාර්ය මණ්ඩලය 48 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් විගණිත දිනය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 9 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 12 දෙනෙකු පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු පිරවීම වෙනුවට අනුමත කාර්ය මණ්ඩලය වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 9 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණි.

(ආ) ආයතනයේ මානව සම්පත් සැලසුමෙහි අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පරිගණක යෙදවුම් සහායක හා රියදුරු තනතුරු සඳහා 2 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර අනුමත සැලසුමෙහි ඇතුලත් නොවූ තනතුරු 5 ක් සඳහා 12 දෙනෙකු විධිමත් අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණි.

## 4.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරිම වෙනුවෙන් රු. මිලියන 130ක් වැය කිරීමට අපේක්ෂිත බව සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි.

(ආ) භූමි අලංකරණය සඳහා සැපයුම්කරුවකු තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ප්‍රකාරව වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් 3 ක් කැඳවිය යුතු වන නමුත්, 2011 වර්ෂයේ සිට අදාල සේවා සපයන සේවා සැපයුම්කරුටම මෙම කොන්ත්‍රාත්තුව රු.432,000 කට පිරිනමා තිබූ අතර මිල ගණන් ඇගයීමේ දී අනෙක් මිල ගණන් දෙක සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට ඡායා පිටපත් ඉදිපත් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------

2003 පෙබරවාරි 02 දිනැති අංක පීඊඞී/12 දරන චක්‍රලේඛයට අනුව වාර්ෂික ගිණුම් විගණනය සඳහා මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2016 මාර්තු 18 දින ගිණුම්වල කෙටුම්පතක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද සංශෝධිත ගිණුම් විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2016 ඔක්තෝබර් 24 දිනය.

### 5.2 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන සැලසුමෙන් ආවරණය කිරීමට අපේක්ෂිත විෂයයන් 5 ක් දක්වා තිබුණු නමුත් වර්ෂය තුළ විගණන කාර්යයන් 02 ක් පමණක් නිම කර තිබුණි. තවද අදාල විගණන කාර්යයන් සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ වාර්තා කිසිවකට ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

### 5.3 විගණන කමිටු

--------------

සමාලෝචිත වර්ෂයේ විගණන කමිටු රැස්වීම් 03ක් පවත්වා තිබූ අතර 2016 වර්ෂය සඳහා රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

--------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 23 සිට සියයට 78 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂකගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් කළමනාකරණය | (i) වත්කම් ප්‍රත්‍යාගණනය, අපහරණය සහ ඒ පිළිබඳ ගිණුම් තැබීමේ අඩුපාඩු සහ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම.<br><br>(ii) ස්ථාවර වත්කම් ලැබීම් නිකුත් කිරීම් ලේඛනගත කිරීම සඳහා භාවිතා කරන පරිගණක මෘදුකාංගය සහ ගනුදෙනු ගිණුම් තැබීම සඳහා භාවිතා කරන මෘදුකාංගය අතර අන්තර් සම්බන්ධතාවයක් නොතිබීම. |
| (ආ) ගිණුම්කරණය | (i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල නොකිරීම.<br><br>(ii) අයවිය යුතු මුදල් ගණනය කිරීමේ, අයකිරීමේ සහ ගිණුම් තැබීමේ දුර්වලතා. |
| (ඇ) ස්වයං මූල්‍ය පාඨමාලා කළමනාකරණය | ආයතනයේ සම්පත් භාවිතා කරමින් කාර්ය මණ්ඩලයට ප්‍රතිලාභ ලබා දීම. |
| (ඈ) ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ප්‍රසම්පාදන අත්පොත සහ ප්‍රසම්පාදන සැලසුම් අනුව කටයුතු නොකිරීම. |
| (ඉ) **අභ්‍යන්තර පාලනය** | පොත් තබන්නා තනතුර සඳහා පරිගණක යෙදවුම් සහකාරවරියක යොදවා වැඩ බෙදීමකින් තොරව වවුචර් පිළියෙල කිරීමේ සිට මුදල් භාරකරුගේ වැඩ දක්වා සියලු කටයුතු එම නිලධාරියාගෙන් කරවා ගැනීම. |